චක්‍රලේඛ අංක 2010/03

මගේ අංකය:- එප්ප්/211/2010
මැතිවරණ කොමසාරිස් කාර්යාලය
සරණ මාවත,
රාජගිරිය.

2010.04.09

මහ බැංකු අධිපති,
අමාත්‍යාංශ ලේකම්වරුන් / ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
රාජ්‍ය සංස්ථා හා ව්‍යාවස්ථාපිත මණ්ඩලවල
සභාපතිවරුන් වෙත,

## පාර්ලිමේන්තු මැතිවරණය - 2010.04.08
## මැතිවරණ කාර්ය මණ්ඩලයට ගෙවීම්

2010.04.08 දින පැවැති පාර්ලිමේන්තු මැතිවරණ ඡන්ද විමසීමේ දී මැතිවරණ කොමසාරිස්වරයාගේ හෝ තේරීම්භාර නිලධාරීගේ උපදෙස් මත මැතිවරණ රාජකාරිවල නිරත කාර්ය මණ්ඩලයට ගෙවිය හැකි ගාස්තු ප්‍රමාණයන් හා එම ගෙවීම්වලට අදාළ ගිණුම් කාර්ය පරිපාටිය පහත දැක්වේ.

02. මැතිවරණ කාර්ය මණ්ඩලයට ගෙවීම් කිරීමට පෙර මෙම චක්‍රලේඛය, ඊට සම්බන්ධ අනෙකුත් චක්‍රලේඛ හා ආයතන සංග්‍රහයේ විධිවිධාන මැනවින් කියවා බලන ලෙස ඔබගේ ගිණුම් කාර්ය මණ්ඩලයට උපදෙස් දිය යුතුය. මෙම චක්‍රලේඛයේ සඳහන් උපදෙස් වලින් පරිබාහිරව එක් එක් ආයතන වලින් කරනු ලබන ගෙවීම් ප්‍රතිපූර්ණය කිරීමට මුදල් සපයා දෙනු නො ලැබේ. එහෙයින් මෙම චක්‍රලේඛයේ උපදෙස් පරිදි මැතිවරණ කාර්ය මණ්ඩලයට ගෙවීම් සිදු කළ යුතු අතර මෙම උපදෙස් වලින් පරිබාහිරව කරන ගෙවීම් පිළිබඳ වගකීම ගෙවීම් කරන නිලධාරියා විසින් ම භාරගත යුතු වනු ඇත.

### 03. තමන් සේවය කරන සේවා ස්ථානයෙන් ගෙවීම් කළ හැකි කාර්යයන්

උක්ත ඡන්ද විමසීමේ දී පහත සඳහන් විශේෂ කාර්යයන් හි යෙදුන නිලධාරීන්ට මෙහි සඳහන් උපදෙස් පරිදි තම ස්ථිර සේවා ස්ථානවල දී ගමන් වියදම් හා දීමනා ගෙවිය හැකිය. එම විස්තර මෙහි 11.1 - 11.2 වගන්තිවල දැක්වෙන පරිදි මවෙත වාර්තා කළ පසු එම ගෙවීම් සඳහා මුදල් මවිසින් ප්‍රතිපූර්ණය කරනු ලැබේ.

i. කලාප භාර සහකාර තේරීම්භාර නිලධාරීන් වශයෙන් හෝ ඡන්ද ප්‍රදේශ මට්ටමින් පිහිටුවනු ලැබූ සම්බන්ධීකරණ කාර්යාලයක සහකාර තේරීම්භාර නිලධාරීන් වශයෙන් කටයුතු කිරීම. (දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හෝ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල පිහිටුවනු ලබන පොදු පහසුකම්, සුභසාධන, ප්‍රවාහන පහසුකම් සැපයීමේ සම්බන්ධීකරණ කමිටුවලට අනුයුක්ත කළ නිලධාරීන් මෙම ගණයට ඇතුළත් නො වේ.)

ii. ඡන්ද පොළක හෝ ඡන්ද ප්‍රදේශ මට්ටමින් පිහිටුවනු ලැබූ විශේෂ සම්බන්ධීකරණ කාර්යාලයක ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති, කණිෂ්ඨ ඡන්ද ස්ථානාධිපති, ලිපිකරු හෝ කාර්යාල කාර්ය සහායක වශයෙන් කටයුතු කිරීම.

iii. ඡන්ද විමසීමට පෙර දින ඡන්ද පෙට්ටි නිකුත් කිරීමේ ශාලාවක දී ඡන්ද පත්‍රිකා හා ඡන්ද පෙට්ටි ආදිය නිකුත් කිරීමේ හා ආපසු භාර ගැනීමේ කාර්යයන් වල නිරත වීම.

iv. ඡන්ද ගණන් කිරීමේ ශාලාවන් හි ගණන් කිරීමේ කටයුතු කිරීම.

ඉහත කී කාර්යයන් සඳහා වුව ගෙවීම් කළ හැක්කේ අදාළ කාර්යයන් සඳහා පත් කිරීමේ ලිපියක් මගින් නිලධාරීන් නිශ්චිතව ම පත්කර ඇත්නම් හා එම කාර්යයන් ඉටුකර ඇති බව අදාළ පැමිණීමේ සහතිකයක් මගින් සනාථ කෙරෙන්නේ නම් පමණි.

04. **තමන් සේවය කළ මැතිවරණ කාර්යාලවලින් පමණක් ගෙවීම් ලබා ගතයුතු කාර්යයන්**

පහත සඳහන් කාර්යයන් හි නියුතු නිලධාරීන්ට ඒ වෙනුවෙන් වූ ගෙවීම් ඔවුන් සේවය කළ මැතිවරණ කාර්යාලයෙන් පමණක් සිදු කළ යුතුය. මෙම කාර්යයනට නිලධාරීන්ගේ ස්ථිර සේවා ස්ථානවලින් ගෙවීම් කර ප්‍රතිපූර්ණය කිරීම සඳහා මවෙත හෝ නියෝජ්‍ය/ ජ්‍යෙෂ්ඨ සහකාර/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වෙත ඉදිරිපත් කෙරෙන ඉල්ලීම් ප්‍රතික්ෂේප කිරීමට සිදුවන බව කරුණාවෙන් සලකන්න. මෙම කාර්යයෙහි නියැලි නිලධාරීන් ඒ වෙනුවෙන් වවුචර් ඉදිරිපත් කළ පසු අදාල තේරීම්භාර නිලධාරීගේ හෝ නියෝජ්‍ය/ ජ්‍යෙෂ්ඨ සහකාර/ සහකාර මැතිවරණ කොමසාරිස්ගේ උපදෙස් පරිදි කටයුතු කරමින් එම වවුචර් හා අදාල ලියවිලි ගෙවීම් කිරීම සඳහා හැකි ඉක්මණින් දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය වෙත ලැබීමට සැලැස්විය යුතුය.

අ. පුහුණු පංතිවලට හා උපදෙස් රැස්වීම්වලට සහභාගී වීම.

ආ. පත්වීම් ලිපි/ ලිපිගොනු භාර ගැනීමට කලින් දිනයක පැමිණීම.

ඇ. තේරීම්භාර නිලධාරීගේ උපදෙස් මත මූලික කටයුතුවල නිරතවීම.

ඈ. සුහසාධන / සෞඛ්‍ය හා සනීපාරක්ෂක/ ප්‍රවාහන / ශාලා සකස් කිරීම/ පොදු පහසුකම්/ සම්බන්ධීකරණ ආදී කමිටුවල සේවය කිරීම.

ඉ. ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා වෙනත් කාර්යාලවල සංචිතවල කටයුතු කිරීම.

ඊ. සේවා අපේක්ෂාවෙන් රැඳී සිටීම. (පොරොත්තු සේවා)

උ. පොකුරු ඡන්ද මධ්‍යස්ථානවල විශේෂ රාජකාරිවල නියුක්ත නිලධාරීන්ට ගෙවීම්

ඌ. තේරීම්භාර නිලධාරී කාර්යාලවලින් හෝ මැතිවරණ කාර්යාලවලින් පමණක් ගෙවිය යුතු යැයි දක්වා ඇති ගෙවීම්

එ. ඉහත 03 වගන්තියේ නිශ්චිතව සඳහන් නො වන වෙනත් කටයුතු වෙනුවෙන් ගෙවීම.

05. **ගමන් වියදම්**

අදාල කාර්යය සඳහා වූ පත්කිරීමේ ලිපියකින් හා එම කාර්යය ඉටුකළ බවට වූ පැමිණීමේ සහතිකයකින් සනාථ කෙරෙන්නේ නම් ඉහත 03 ජේදයේ සඳහන් මැතිවරණ රාජකාරි සඳහා පහත දැක්වෙන වෙනස් කිරීම්වලට යටත්ව ආයතන සංග්‍රහයේ xiv වන පරිච්ඡේදයෙහි දැක්වෙන පරිදි ගමන් වියදම් ලබා ගැනීමට නිලධාරීන්ට හිමිකම් ලැබේ.

5.1. සහකාර තේරීම් භාර නිලධාරියෙකු, ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයෙකු, කණිෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයෙකු, ඡන්ද පොළ ලිපිකරුවෙකු හෝ කාර්යාල කාර්ය සහායකයෙකු වශයෙන් තෝරාගෙන ඇති නිලධාරියෙකු ඉහත කටයුතු සඳහා යාමේ දී ගමන ආරම්භ කරන ස්ථානය සේ සැලකිය යුත්තේ නිලධාරියාගේ සේවා ස්ථානයයි. <u>ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයෙකු කැටුව යන රජයේ සේවකයෙකු නො වන කාර්යාල කාර්ය සහායකයෙකුගේ කල්පිත සේවා ස්ථානය සේ සැලකිය යුත්තේ එම ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයාගේ සේවා ස්ථානයයි.</u>

5.2. නිලධාරියා ගමන පිටත් වන්නේ තමන් පදිංචි නිවසෙහි සිට නම් හා එම නිවස ඔහුගේ සේවා ස්ථානයේ සිට සැතපුම් 15ක් (කිලෝමීටර් 24) ඇතුලත පිහිටා ඇත්තේ නම්, ඔහු එම නිවසෙහි සිට ගමන ආරම්භ කළා සේ සැලකිය හැකිය. ඔහු ගමන පිටත්වීම ආරම්භ කරන නිවස සේවා ස්ථානයේ සිට සැතැපුම් 15 කට (කිලෝමීටර් 24) වැඩි දුරක පිහිටා ඇති විට උපරිම වශයෙන් සැතැපුම් 15 ක (කිලෝමීටර් 24) දුරකින් පිහිටි කල්පිත ස්ථානයක සිට ගමන ආරම්භ කළා සේ සැලකීමට ඉඩ දිය හැකිය.

5.3. තේරීම් භාර නිලධාරීන් වෙත කල් ඇතිව වාර්තා කරන ලෙස උපදෙස් ලැබී ඇති නිලධාරීන්ට තේරීම්භාර නිලධාරීන් විසින් තාවකාලික නවාතැන් සඳහා ස්ථාන, සපයනු ලැබේ. එම ස්ථානවල නො රැඳී වෙනත් ස්ථානයක නවාතැන් ගත හොත් එවැනි නිලධාරියෙකුට ගමන් ගාස්තු ගෙවිය හැක්කේ උපරිම වශයෙන් සැතපුම් 4 (කිලෝමීටර් 7) ක දුරක් සඳහා පමණි.

5.4. ඡන්ද පොළක ඡන්ද විමසීමේ රාජකාරිවල යෙදීමට නියමිත නිලධාරියෙකු ඡන්ද විමසීමට පෙර දින රාත්‍රී තම ඡන්ද පොළෙහි හෝ තේරීම්භාර නිලධාරී නියම කළ ස්ථානයක නතර වීමට උපදෙස් ලැබ, ඇත්ත වශයෙන් ම එම ස්ථානයේ රාත්‍රිය ගත කරන ලද්දේ නම්, ගමන් කළ දුර ප්‍රමාණය සැතපුම් 4 කට (කිලෝමීටර් 7) අඩු වුවද, ආයතන සංග්‍රහයේ සඳහන් ගාස්තු ප්‍රමාණයන් අනුව සංයුක්ත දීමනා ගෙවිය හැකිය.

5.5. ඡන්ද විමසීමේ දින රාත්‍රී ඡන්ද ගණන් කිරීමේ කාර්යයන් සඳහා ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථානයක රැඳී සිටි නිලධාරීන්ට ද ගමන් කළ දුර ප්‍රමාණය නො සලකා එදිනට පමණක් සංයුක්ත දීමනා ගෙවිය හැකිය.

5.6. එහෙත් ඡන්ද විමසීමට පෙර දින ඡන්ද පෙට්ටි නිකුත් කිරීමේ යෙදුණ නිලධාරීන්ට එම කාර්යය අවසන් කර නිවෙස් බලා යාමට කාල වේලා ඇති හෙයින් එදින එම කටයුතු වල නිරත නිලධාරීන්ට සංයුක්ත දීමනා ගෙවිය හැක්කේ එම කටයුතුවල යෙදුන ස්ථානය ඔවුන්ගේ ස්ථිර සේවා ස්ථානය පිහිටි නාගරික බල ප්‍රදේශයෙන් බැහැරව පිහිටියේ නම් සහ එම රාජකාරිවල යෙදුන ස්ථානය ආයතන සංග්‍රහයේ සඳහන් පරිදි දුරක පිහිටියේ නම් ද, සැබවින්ම තම නිවසින් බැහැරව නතරවීමට තරම් රාජකාරි අවශ්‍යතාවයක් තිබුනේ නම් ද පමණි.

5.7. මැතිවරණ කොමසාරිස්වරයා විසින් හෝ තේරීම්භාර නිලධාරියා විසින් නියම කර ඇති දිනයන් හා වේලාවන්වල දී නිලධරයන් ගමන් කළ යුතුය. සංයුක්ත දීමනා ගෙවනුයේ සම්පූර්ණයෙන් ම මෙම පදනම මත වේ. එසේ නියම කර ඇති දින වකවානුව තුළට අයත් නො වන ගෙවීම් කිසිසේත් ප්‍රතිපූර්ණය කරනු නො ලැබේ.

## 06. සැතපුම් ගාස්තු

6.1. I. තේරීම්භාර නිලධාරී/ඔහු විසින් ප්‍රවාහන කටයුතු භාරව ක්‍රියා කිරීමට බලය පවරන ලද නිශ්චිත මාණ්ඩලික නිලධාරියෙකුගේ පූර්ව අනුමැතිය යටතේ ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයෙකු තම ඡන්ද පොළ වෙත ඡන්ද පෙට්ටි ආදිය රැගෙන යාම සහ ඡන්ද විමසීමෙන් පසු ඒවා ආපසු රැගෙන ඒම සඳහා **තමන් විසින්ම රැගෙන ආ වාහනයක් යොදවා ගනු ලැබී නම්** 6.5 හි පරිදි මවිසින් නිකුත් කර ඇති කොන්දේසි හා උපදෙස්වලට යටත්ව කිලෝමීටරයකට රු.15/- බැගින් වන පරිදි එම වාහනය සඳහා සැතපුම් ගාස්තු ගෙවිය හැකිය.

II. ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා තමන් විසින් රැගෙන ආ වාහනය පැදවීමට යොදා ගන්නා පෞද්ගලික රියදුරුට (රජයේ නොවන) දිනක වැටුප රු. 350.00 ක් ගෙවිය හැකි අතර දිනකට (පැය 12 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇත්නම්) රු. 350.00 බැගින් සංයුක්ත දීමනාව ද ගෙවිය හැකිය. එම වවුචර් ඔහු විසින් කාර්යය ඉටු කළ දිස්ත්‍රික්කයේ තේරීම්භාර නිලධාරී/ නියෝජ්‍ය/ ජ්‍යෙෂ්ඨ සහකාර/ සහකාර මැතිවරණ කොමසාරිස් වෙත ඉදිරිපත් කළ යුතුය. මෙම ගෙවීම් කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන්ට පෞද්ගලික වාහන පාවිච්චිය සඳහා ලබා දෙන සහතිකය වවුචරය සමඟ ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

III. එලෙස රැගෙන ආ වාහනයක් රාජකාරි සඳහා යොදා ගත්තේ නම් පමණක් නිලධාරියාගේ ගමන් වියදම් ඉල්ලුම්පත (ඡන්දපොළ රාජකාරි හා ගණන් කිරීමේ රාජකාරි සඳහා දීමනා ලබා ගැනීම පිණිස අදාළ වූ වවුචර්පත් ද සමඟ කණිෂ්ඨ සේවකයෙක් යොදවා ගනු ලැබුවේ නම් හෝ තේරීම්භාර නිලධාරී ලිඛිත උපදෙස් මත යම් විශේෂිත අවස්ථාවක දී කණිෂ්ඨ සේවකයින් දෙදෙනකු සේවයේ යොදා ගනු ලැබුවේ නම් ඔහුට/ඔවුනට කළ යුතු ගෙවීම් සඳහා වූ වවුචර්පත් ඇතුළුව) අදාළ කාර්යයන් ඉටුකළ බව සනාථ කිරීම සඳහා ලබාගත් පැමිණීමේ සහතික ද සමඟ තේරීම්භාර නිලධාරී/ නියෝජ්‍ය/ ජ්‍යෙෂ්ඨ සහකාර/ සහකාර මැතිවරණ කොමසාරිස් වෙත ඉදිරිපත් කළ යුතුය.

IV. <u>එම නිලධාරීන්ට තම ස්ථිර සේවා ස්ථානවල දී ඉහත සඳහන් ගෙවීම් සිදු කර ප්‍රතිපූර්ණය සඳහා මවෙත ඉදිරිපත් නො කළ යුතුය.</u> ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා තමන් විසින් රැගෙන ආ වාහනයක් පාවිච්චි නො කරන්නේ නම් පමණක් මෙම ගෙවීම් තමන් සේවය කරන ස්ථිර සේවා ස්ථානයෙන් ලබා ගෙන ප්‍රතිපූර්ණය කරවා ගැනීමට හැකිය.

V. ඡන්ද පොළ කටයුතුවලට හැර අනෙකුත් කටයුතු සඳහා සහභාගී වන ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන්ට වාහන රැගෙන යාම වෙනුවෙන් සැතපුම් කුලිය ගෙවනු නො ලැබේ.

6.2. තේරීම්භාර නිලධාරි/ ඔහු විසින් ප්‍රවාහන කටයුතු භාරව ක්‍රියා කිරීමට බලය පවරන ලද නිශ්චිත මාණ්ඩලික නිලධාරියෙකුගේ පූර්ව අනුමැතිය යටතේ කලාප භාර සහකාර තේරීම්භාර නිලධාරියෙකු තම ඡන්ද පොළවල් වල ඉටු කළ යුතු කටයුතු සඳහා තම <u>පෞද්ගලික වාහනය හෝ කළත්‍රයාගේ වාහනයක්</u> යොදවා ගනු ලැබ් නම් හා තේරීම්භාර නිලධාරි නිකුත් කළ සහතිකයකින් එය සනාථ කෙරෙන්නේ නම් ඔවුනට ආයතන සංග්‍රහයේ සඳහන් ගාස්තු ප්‍රමාණයන් අනුව එනම් සැතපුමකට රුපියල් 10.00 බැගින් (කිලෝමීටරයට රු. 6.25 බැගින්) සැතපුම් කුලී ගෙවිය හැකිය.

6.3. 6.1 හි සඳහන් කාර්යයන් සඳහා හැර අනෙකුත් කාර්යයන් සඳහා තම පෞද්ගලික මෝටර් රථය පාවිච්චි කිරීම වෙනුවෙන් ගෙවීම් කළ යුත්තේ වැටුප අනුව සැතපුම් කුලී හිමි නිලධාරීනට පමණක් වන අතර, ආයතන සංග්‍රහයේ xiv පරිච්ඡේදයේ සියළු නියමයන්ට හා සීමාවන්ට යටත්වය. මෙහි දී එම නිලධාරීන් අතුරින් ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරි හා ගණන් කිරීමේ කටයුතුවලට පත්වීම් ලබා දී ඇති සහකාර තේරීම්භාර නිලධාරීන්ට පමණක් තම වාහනය සඳහා රියදුරකු රැගෙන යාමට අවසර දී ඇත. එහෙයින් එම රියදුරුට 6.1 (ii) අනුව ගෙවීම් කළ හැකිය.

6.4. වෙන් කළ වාහන හා සංචිත වාහනවල ඉන්ධන වියදම් ප්‍රතිපූර්ණය කිරීම පිණිස මවිසින් ලබා දී ඇති උපදෙස් පරිදි අදාළ ආකෘතිපත් භාවිතා කර මැතිවරණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය වෙතින් එම ඉන්ධන වියදම් ප්‍රතිපූර්ණය කර ගත යුතුය.

6.5. ප්‍රවාහන කටයුතු සම්බන්ධයෙන් වන ගෙවීම් කිරීම සඳහා PE/24/2010 හා 2010.04.02 දිනැති TR-02 (17) දරණ චක්‍රලේඛයේ උපදෙස් පරිදි කටයුතු කළ යුතු අතර එහි සඳහන් උපදෙස්වලට පරිබාහිරව කටයුතු කර ඇත්නම් ඒ පිළිබඳව ගෙවීම් කිරීමට පෙර මවෙතින් උපදෙස් ලබා ගත යුතුය.

## 07. කාර්යාල කාර්ය සහායකයින්

7.1. ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති විසින් සේවයෙහි යොදවනු ලබන රජයේ සේවකයෙකු නො වන කාර්යාල කාර්ය සහායකයෙකුට ඡන්ද විමසීමට අදාළ මුළු කාර්යය සඳහා මෙහි 8.2 (ඇ) හි සඳහන් දීමනාව ගෙවිය හැකිය. රජයේ සේවකයෙකු නො වන එවැනි සේවකයෙකුට ආයතන සංග්‍රහයේ සඳහන් දිනක අවම සංයුක්ත දීමනාව (දිනකට රු. 350.00) ගෙවිය හැකිය. එවැනි සේවකයකු කැටුව ගිය ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා ස්ථිරව ම සේවය කරන සේවා ස්ථානයෙන් මෙම ගෙවීම සිදු කර ප්‍රතිපූර්ණය කරවා ගැනීමට හැකිය. ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති වරයා තමන් විසින් ම රැගෙන ආ වාහනයක් රැගෙන යන්නේ නම් පමණක් මෙම ගෙවීම් 6.1 (III) ට අනුව ලබා ගත යුතුය.

7.2. සහකාර තේරීම්භාර නිලධාරියෙකු විසින් ස්වකීය සංචාරයෙහි දී කාර්යාල කාර්ය සහායකයෙකු හෝ වෙනත් අයෙකු රැගෙන යාම අවශ්‍ය නැත. එහෙයින් සහකාර තේරීම්භාර නිලධාරියෙකු කැටුව යන කාර්යාල කාර්ය සහායකයෙකු සඳහා කිසිම ගෙවීමක් නො කළ යුතුය.

## 08. දීමනා

8.1. තේරීම්භාර නිලධාරි විසින් ලිඛිතව පත්වීමක් කරනු ලැබ මැතිවරණ රාජකාරිවල නිරත නිලධාරීන් පහත සඳහන් පරිදි වූ පැමිණීමේ සහතිකවලින් ඒ බව සනාථ කරන්නේ නම් ඔවුනට එක් එක් කාර්යයනට පහත පරිදි දීමනා ගෙවිය හැකිය.

8.2. අංක - සීඊ 19 හෝ සීඊ 19/1 දරණ මුද්‍රිත ආකෘතියක වූ පැමිණීමේ සහතිකයකින් සනාථ කෙරෙන්නේ නම් ඡන්ද පොළක ඡන්ද විමසීමේ කටයුතුවල යෙදුන නිලධාරීන්ට එම මුළු කාර්යය සඳහා පහත පරිදි දීමනා ගෙවිය හැකි අතර සීඊ 52 දරණ මුද්‍රිත ආකෘතියක වූ පැමිණීමේ සහතිකයකින් සනාථ කෙරෙන්නේ නම් ඡන්ද ප්‍රදේශ මට්ටමින් පිහිටුවනු ලැබූ සම්බන්ධීකරණ කාර්යාලවල යෙදුන නිලධාරීන්ට ද මුළු කාර්යය සඳහා එම දීමනා ගෙවිය හැකිය.

| | |
|---|---|
| අ. ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති | රු. 2500.00 |
| ආ. කණිෂ්ඨ ඡන්ද ස්ථානාධිපති හා ලිපිකරු | රු. 1400.00 |
| ඇ. කාර්යාල කාර්ය සහායක | රු. 1000.00 |

8.3. විධිමත් පත්වීමක් ලැබ ඡන්ද විමසීමට අදාලව ඡන්ද පොළවල් පරීක්ෂාවේ යෙදුනා වූ කලාප භාර සහකාර තේරීම් භාර නිලධාරීන්ට සීර්/46 දරණ මුද්‍රිත අනු අංකයක් සහිත පැමිණීමේ සහතිකයකින් ඒ බව සනාථ කරන්නේ නම් ඡන්ද විමසීමට පෙර දින හා ඡන්ද විමසීමේ දින යන දෙදිනෙහි ම කටයුතු සඳහා ඒකාබද්ධව රු. 2,750.00 ක දීමනාවක් ගෙවනු ලැබේ. ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් පිහිටුවනු ලැබූ සම්බන්ධීකරණ කාර්යාලවල සේවය කළ සහකාර තේරීම්භාර නිලධාරීට ද සීර් 52 ආකෘතිය මඟින් සනාථ කෙරෙන්නේ නම් මෙම දීමනාව ගෙවිය හැකිය.

8.4. ඡන්ද පෙට්ටි නිකුත් කිරීම සඳහා සීර් 47 දරණ මුද්‍රිත අනු අංකයක් සහිත පැමිණීමේ සහතිකයකින් සනාථ කෙරෙන්නේ නම් ඡන්ද විමසීමට පෙර දින ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් වෙත ඡන්ද පෙට්ටි හා ඡන්ද පත්‍රිකා ආදිය නිකුත් කිරීමේ යෙදුන නිලධාරීන්ට ද ඡන්ද පෙට්ටි භාර ගැනීම සඳහා සීර් 48 දරණ මුද්‍රිත අනු අංකයක් සහිත පැමිණීමේ සහතිකයකින් සනාථ කෙරෙන්නේ නම් ඡන්ද විමසීමේ දින පස්වරුවේ ඡන්ද පෙට්ටි ආදිය භාර ගැනීමේ යෙදුනා වූ නිලධාරීන්ට ද එම එක් එක් දින කාර්යයන් සඳහා පහත සඳහන් පරිදි ගෙවීම් කළ හැක.

| | |
|---|---|
| සහකාර තේරීම්භාර නිලධාරී | රු. 600.00 |
| ජ්‍යෙෂ්ඨ/ කණිෂ්ඨ ඡන්ද ස්ථානාධිපති හා ලිපිකරු | රු. 500.00 |
| කණිෂ්ඨ සේවක | රු. 400.00 |

සීර් 47 හෝ සීර් 48 ආකෘතියේ වූ මුද්‍රිත පැමිණීමේ සහතික හැර වෙනත් ආකෘතිවල වූ පැමිණීමේ සහතික ඉදිරිපත් කරන නිලධාරීන්ට මෙම දීමනා නො ගෙවිය යුතුය.

8.5. නිලධාරියෙකුට ගෙවිය හැක්කේ 8.2, 8.3 හෝ 8.4 හි සඳහන් දීමනාවන් අතුරින් එකක් පමණි. එහෙත් අවශ්‍ය නිලධාරීන් ප්‍රමාණවත් නො වීම නිසා විශේෂිත වූ අවස්ථාවක දී කලාප භාර සහකාර තේරීම්භාර නිලධාරිවරයෙකු වශයෙන් සේවය කළ නිලධාරියකුට ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරියකු වශයෙන් සේවය කිරීම සඳහා පත්වීම් ලිපියක් ලබා දී තිබුණහොත් ඔහුට අදාළ ගෙවීම් කළ හැකිය.

8.6. ඡන්ද ගණන් කිරීමේ හා ප්‍රතිඵල ප්‍රකාශ කිරීමේ කාර්යයනට පමණක් යොදවා ගනු ලබන නිලධාරීන්ට ඉහත 8.2 හෝ 8.3 හි සඳහන් දීමනා නො ගෙවිය යුතුය.

8.7. තේරීම්භාර නිලධාරී විසින් විධිමත් පත්වීමක් (පීර් 8 ආකෘතිය) කරනු ලැබ ඡන්ද ගණන් කිරීමේ ශාලාවක ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරී ලෙස කටයුතු කළ නිලධාරියෙකු එසේ සේවය කළ බව සීර් 50 දරණ මුද්‍රිත අනු අංකයක් සහිත පැමිණීමේ සහතිකයකින් සනාථ කරන්නේ නම් එම කාර්යයට රු. 5,000.00ක දීමනාවක් ගෙවිය හැක.

8.8. සීර් 49 දරණ මුද්‍රිත අනු අංකයක් සහිත පැමිණීමේ සහතිකයකින් සනාථ කෙරෙන්නේ නම්, ඡන්ද ගණන් කිරීමේ හා ප්‍රතිඵල ප්‍රකාශ කිරීමේ කටයුතුවල නිරත වන අනෙකුත් නිලධාරීන්ට එම කාර්යයට පහත සඳහන් දීමනා ගෙවිය හැක.

| | |
|---|---|
| සහකාර තේරීම්භාර නිලධාරී | රු. 2,750.00 |
| ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති | රු. 1,900.00 |
| කණිෂ්ඨ ඡන්ද ස්ථානාධිපති හා ඡන්ද ලිපිකරු | රු. 1,700.00 |
| කාර්යාල කාර්ය සහායක | රු. 1,000.00 |

8.9. සීර් 53 දරණ මුද්‍රිත ආකෘතියකින් යුත් පැමිණීමේ සහතිකයකින් සනාථ කෙරෙන්නේ නම් පමණක් ප්‍රවාහන, සුභසාධන, පොදු පහසුකම් වැනි කමිටුවල රාජකාරි ඉටු කළ කාර්යය මණ්ඩලයට ඔවුන්ව පත් කර ඇති තනතුර අනුව 8.4 හා 8.8 හි සඳහන් දීමනාවන් ඔහු සේවය කළ මැතිවරණ කාර්යාලයෙන් ගෙවීමට නියෝජ්‍ය/ ජ්‍යෙෂ්ඨ සහකාර/ සහකාර මැතිවරණ කොමසාරිස්ට විශේෂ උපදෙස් ලබා දී ඇත. මෙම දීමනා තමන් ස්ථිර වශයෙන් සේවය කරන කාර්යාලයෙන් ලබා නො ගතයුතු අතර එසේ ලබා ගත හොත් මැතිවරණ කාර්යාලයෙන් එවැනි ගෙවීම් ප්‍රතිපූර්ණය කරනු නො ලැබේ.

8.10. ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරි සඳහා සහායකයෙකු රැගෙන යාමට මවිසින් උපදෙස් දී ඇති හෙයින් ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරි විසින් එවැනි අයෙකු රැගෙන ගොස් ඇත්නම් ඔහුගේ පත්වීම් ලිපිය හා පැමිණීමේ සහතිකය මගින් සනාථ කෙරෙන්නේ නම් ගණන් කිරීමේ ශාලාවේ කටයුතු කල තනතුර අනුව ඔහුට ගණන් කිරීමේ දීමනාව ගෙවිය හැකිය.

8.11. නිලධාරියෙකුට ගෙවිය හැක්කේ 8.7 හෝ 8.8 සඳහන් දීමනා අතුරින් එකක් පමණි.

8.12. උක්ත දීමනා ගෙවිය හැක්කේ ඉහත උප වගන්තිවල සඳහන් මුද්‍රිත ආකෘතිවල වූ පැමිණීමේ සහතික ඉදිරිපත් කරන නිලධාරීන්ට පමණි. අදාල සේවාවන් ඉටුකල බවට වෙනත් ආකෘතිවල පැමිණීමේ සහතික ඉදිරිපත් කරන නිලධාරීන්ට ගෙවීම් කිරීම සඳහා අදාල වවුචර් එම සේවා ඉටුකරන ලද දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය/ ජ්‍යෙෂ්ඨ සහකාර/ සහකාර මැතිවරණ කොමසාරිස් වෙත යැවීමට අදාල නිලධාරීන්ට උපදෙස් දිය යුතුය.

8.13. ඉහත සඳහන් 8.2, 8.3, 8.4, 8.7, 8.8 හා 8.9 ඡේදවල සඳහන් දීමනා ලබාගන්නා නිලධාරීනට එම කාලය සඳහා අතිකාල හෝ නිවාඩු දින වැටුප් නො ගෙවිය යුතුය.

8.14. රියදුරන්ට හැර අනෙකුත් නිලධාරීන්ට හා සේවකයන්ට තම ස්ථිර සේවා ස්ථානවලින් ගෙවන නිවාඩු දින වැටුප් හෝ අතිකාල ප්‍රතිපූර්ණය කරනු නො ලැබේ.

## 09. වාහනවල රියදුරන්ට ගෙවීම

9.1. මැතිවරණ කොමසාරිස්ගේ හෝ තේරීම්භාර නිලධාරීන්ගේ ඉල්ලීම පරිදි අප්‍රේල් 04 වෙනි දින සිට අප්‍රේල් 10 දින දක්වා (එම දෙදින ද ඇතුලත්ව) කාලය තුල පමණක් ඡන්ද විමසීමට අදාල රාජකාරීවල යොදවන ලද වාහනවල රියදුරන්ට (සීඊ 51 ආකෘතියේ වූ පැමිණීමේ සහතිකයකින් සනාථ වන්නේ නම්) අතිකාල හා සංයුක්ත දීමනා ඔවුන්ගේ ආයතනවලින් ලබාගත හැකි අතර, මැතිවරණ කොමසාරිස් වෙතින් එම ගෙවීම් ප්‍රතිපූර්ණය කරවා ගත හැකිය. එහෙත් 9.2 යටතේ සඳහන් වන රියදුරන්ට ඔවුන්ගේ ස්ථිර සේවා ස්ථානවල දී එම ගෙවීම් නො කල යුතුය.

9.2. 9.1 ඡේදය යටතේ කෙසේ සඳහන් වුවද මැතිවරණ කටයුතු සම්බන්ධයෙන් වන පහත සඳහන් පරිදි සහ පහත සඳහන් කාර්යාලවල රාජකාරීවල නිරතව ඇති රියදුරන්ට ගෙවීම් තම කාර්යාලවලින් සිදු නො කල යුතු අතර එම රියදුරන්ට ගෙවීම් සඳහා වවුචර් ඔහු සේවය කල දිස්ත්‍රික්කයේ තේරීම්භාර නිලධාරි හෝ නියෝජ්‍ය/ජ්‍යෙෂ්ඨ සහකාර/ සහකාර මැතිවරණ කොමසාරිස් වෙත ඉදිරිපත් කල යුතුය.

i. <u>අප්‍රේල් 04 වෙනි දින සිට අප්‍රේල් 10 දින දක්වා වූ</u> කාලසීමාවෙන් බැහැර වූ දිනයන්හි දී මැතිවරණ කටයුතුවල අදාලව සේවයේ නිරතව ඇති රියදුරන් සේවය කර ඇති මුළු කාලය සඳහාම වූ වවුචර් ඔවුන් සේවය කල තේරීම්භාර නිලධාරීන් හෝ නියෝජ්‍ය/ ජ්‍යෙෂ්ඨ සහකාර/ සහකාර මැතිවරණ කොමසාරිස් වෙත ඉදිරිපත් කල යුතුය.

ii. <u>ඡන්ද විමසීම පැවැත්වූ දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල රියදුරන් හා එම කාර්යාලවලින් වැටුප් ලබන වෙනත් කාර්යාලවල රියදුරන්ගේ</u> මැතිවරණ රාජකාරි සඳහා වන ගෙවීම් වවුචර් නියෝජ්‍ය/ ජ්‍යෙෂ්ඨ සහකාර/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වෙත ඉදිරිපත් කල යුතුය.

iii. <u>ඡන්ද විමසීම පැවැත්වූ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල රියදුරන් හා එම කාර්යාලවලින් වැටුප් ලබන වෙනත් කාර්යාලවල රියදුරන්ගේ</u> මැතිවරණ රාජකාරි සඳහා වන ගෙවීම් වවුචර් නියෝජ්‍ය/ ජ්‍යෙෂ්ඨ සහකාර/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වෙත ඉදිරිපත් කල යුතුය.

9.2 ඡේදය යටතට ගැනෙන රියදුරන්ට තම ආයතනවලින් ගෙවීම් කර එම ගෙවීම් ප්‍රතිපූර්ණය සඳහා ඉල්ලීම් මැතිවරණ කොමසාරිස් වෙත ඉදිරිපත් නො කල යුතු අතර එවැනි ගෙවීම් කිසිවිටකත් ප්‍රතිපූර්ණය කරනු නො ලැබේ.

9.3. මැතිවරණ දිනවල වුව ආරක්ෂක අවශ්‍යතා සඳහා පොලිස් ස්ථානවල සේවයේ යොදවන රියදුරන්ට ගමන් වියදම් හා අතිකාල පොලිස් දෙපාර්තමේන්තුව මගින් ගෙවීම් කල යුතු අතර එම ගෙවීම් ප්‍රතිපූර්ණය සඳහා මැතිවරණ කාර්යාල වෙත ඉදිරිපත් නො කල යුතුය.

9.4. රියදුරන්ට ගෙවීම් කළ යුත්තේ ආයතන සංග්‍රහයේ නියමයන් හා ගාස්තු ප්‍රමාණයන් අනුව වේ.

## 10. පුහුණු පන්තිවලට සහභාගීවීමේ වියදම්

10.1. නිලධාරීනට වියදමක් නොමැතිව සහභාගී වීමට හැකි වන පරිදි පුහුණු පන්ති පැවැත්වීමට සියළු ප්‍රයත්නයන් දරනු ලැබීය. කෙසේ වුවද, පුහුණු පන්තිවලට සහභාගීවීම සඳහා දරන ලද ගමන් වියදම් ලබා ගැනීමට අපේක්ෂා කරන නිලධාරීන් ඒ සඳහා වූ තම ගමන් වියදම් වවුචර් පුහුණු පන්ති සඳහා කැඳවීම් සිදු කරනු ලබන දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ තේරීම්භාර නිලධාරී හෝ නියෝජ්‍ය/ ජ්‍යෙෂ්ඨ සහකාර/ සහකාර මැතිවරණ කොමසාරිස් වෙත ඉදිරිපත් කළ යුතුය.

10.2. පුහුණු පන්තිවලට යාම සඳහා කුලී මෝටර් රිය ගාස්තු හෝ ඉල්ලා ගත් වාහනවලට සැතපුම් ගාස්තු ගෙවනු නො ලැබේ.

10.3. පුහුණු පන්තිවලට සහභාගි වූ නිලධාරීන්ට ගෙවීම් සඳහා මුදල් වෙන්කර දෙන ලෙස ආයතන ප්‍රධානීන් නො ඉල්ලීය යුතුය. එසේම මෙම කරුණ සඳහා තම ආයතනයෙන් ගෙවීම් කර එම මුදල ප්‍රතිපූර්ණය කරන ලෙස මැතිවරණ කොමසාරිස්ගෙන් හෝ නියෝජ්‍ය/ ජ්‍යෙෂ්ඨ සහකාර/ සහකාර මැතිවරණ කොමසාරිස්වරයාගෙන් නො ඉල්ලීය යුතුය.

10.4. පුහුණු පන්ති වලට සහභාගිවීම වෙනුවෙන් නිවාඩු දින වැටුප්, අතිකාල හෝ දීමනා ගෙවනු නො ලැබේ.

## 11. ගෙවීම් හා ප්‍රතිපූර්ණය කරවා ගැනීම

11.1. ඡන්ද විමසීමේ කටයුතුවල යෙදුන නිලධාරීනට මෙම චක්‍රලේඛය අනුව දීමනා තම ස්ථිර සේවා ආයතනවලින් ගෙවිය හැක. එම ගෙවීම් පිළිබඳ විස්තර මෙම චක්‍රලේඛයට යාකර ඇති "ඒ ආකෘතිය" ප්‍රකාර ගෙවීම් උපලේඛනයක් ද සහිතව සහතිකයක් එවීමෙන් එම මුදල් මැතිවරණ කොමසාරිස් වෙතින් ප්‍රතිපූර්ණය කරවා ගත හැක. (රජයේ ආයතනවල රියදුරන්ට ගෙවිය යුතු ගමන් වියදම් හා අතිකාල මෙම ආකෘතියට ඇතුලත් නො කළ යුතු බව කරුණාවෙන් සලකන්න.)

11.2. මෙහි 9.1 ඡේදය අනුව රියදුරන්ට ගෙවන ගමන් වියදම් හා අතිකාල පිළිබඳව මෙයට යා කර ඇති "බී ආකෘතිය" අනුව සම්පූර්ණ කරන ලද උපලේඛනයක් එවීමෙන් එම ගෙවීම් ප්‍රතිපූර්ණය කරවා ගත හැක.

11.3. ඉහත කී ලේඛන සමග <u>අදාළ ගෙවීම් වවුචර් ම වෙත නො එවිය යුතුය. ගෙවීම් වවුචර් අදාළ ආයතනයේ අනෙකුත් වවුචර් සමග විගණනය සඳහා ඉදිරිපත් කිරීමට ඔබ ආයතනයේ ආරක්ෂාකාරීව තබාගත යුතුය.</u>

11.4. ගෙවීම් උපලේඛනවල පැහැදිලි මුල් පිටපත් පමණක් මෙම කාර්යාලයට ඉදිරිපත් කළ යුතු අතර ෆැක්ස් මගින් එවන උපලේඛන ප්‍රතික්ෂේප කරනු ලැබේ.

11.5. ආදර්ශ ආකෘතියෙන් අපේක්ෂිත තොරතුරු සම්පූර්ණව හා නිවැරදිව සැපයිය යුතුය. එසේම නිලධාරීන්ට ගෙවනු ලබන විවිධ දීමනා වෙන් වෙන්ව නිවැරදිව තීරුවල ඇතුලත් කළ යුතුය. අසම්පූර්ණ හෝ සදොස් තොරතුරු ඉදිරිපත් කරනු ලබන අවස්ථාවල දී විමසීම් කිරීමට හා නිවැරදි තොරතුරු සොයා බැලීමට සිදුවන හෙයින් එවැනි ප්‍රතිපූර්ණ කිරීම් පමාවීමට ඉඩ ඇති බව සලකන්න.

11.6. අමාත්‍යාංශ හා රජයේ දෙපාර්තමේන්තුවල නිලධාරීනට එම කාර්යාලවල අක්මුදල් මගින් ද, සංස්ථා, පළාත් පාලන ආයතන වැනි වෙනත් කාර්යාලවල නිලධාරීන්ට එම ආයතනවල අරමුදල් මගින් ද, මෙම ගෙවීම් කළ හැක.

11.7. <u>ගෙවීම් කිරීමට ප්‍රමාණවත් අක්මුදල් හෝ අරමුදල් නොමැති ආයතනවල (විශේෂයෙන් කලාප අධ්‍යාපන කාර්යාලවල) නිලධාරීන්ගේ වවුචර් නිසි පරිදි පරීක්ෂා කොට ගෙවිය යුතු නිවැරදි මුදල පිළිබඳ විස්තර ඉහත සඳහන් ආදර්ශ ආකෘතිය අනුව දන්වා එවූ පසු පරීක්ෂා කර එම මුදල නිදහස් කරනු ලැබේ.</u>

## 12. ගෙවීම් උපලේඛන සකස් කිරීම

12.1. ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරි, කලාප භාර සහකාර තේරීම්භාර නිලධාරි, ඡන්ද පෙට්ටි නිකුත් කිරීම, භාර ගැනීම, ගණන් කිරීම භාර සහකාර තේරීම්භාර නිලධාරීන්, ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන්, කණිෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන්, ලිපිකරුවන් හා කාර්යාල කාර්ය සහායකයින් වශයෙන් සේවය කළ කාර්ය මණ්ඩලයට ගෙවීම් මෙහි "ඒ ආකෘතිය" යටතේ නිවැරදිව ඇතුලත් කර ඉදිරිපත් කළ යුතුය.

12.2. නිලධාරීන්ට ගෙවනු ලබන ගමන් වියදම්, සැතපුම් ගාස්තු සහ සංයුක්ත දීමනා "ඒ" ආකෘතියේ 5 වන තීරුව යටතේ ද මෙහි 6.1 (iii) වගන්තිය පරිදි පෞද්ගලික රියදුරන්ට ගෙවන ගමන් වියදම් සහ සංයුක්ත දීමනා "බී" ආකෘතියේ 6 වෙනි තීරුව යටතේ ද දැක්විය යුතුය.

12.3. ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයෙක් තම ඡන්ද පොළෙහි කටයුතු සඳහා කාර්යාල කාර්ය සහායකයෙකු වශයෙන් රජයේ සේවයෙන් බැහැර අයෙකු යොදවා ගනු ලැබ් නම් ද, එම සේවකයාට කළ යුතු ගෙවීම ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා නමින් ම ලබා ගනු ලැබ් නම් ද, එම සේවකයා වෙනුවෙන් ගෙවූ ගමන් වියදම් හා සංයුක්ත දීමනා උක්ත ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයාගේ නම ඉදිරියේ "ඒ" ආකෘතියේ 5 වෙනි තීරුවේ දැක්විය යුතු අතර ඡන්ද පොළ දීමනාව පමණක් 9 වන තීරුවේ ඇතුළත් කළ යුතුය.

12.4. රජයේ සේවකයෙක් නො වන කාර්යාල සේවකයෙකුට ගෙවිය යුතු ගමන් වියදම් හා දීමනා එම සේවකයා නමින් වූ වවුචර් වලින් ම ගෙවන ලද්දේ නම් අදාල උපලේඛනයේ ඔහුගේ නම සඳහන් කර ඒ ඉදිරියේ ("ඒ" ආකෘතිය) දෙවන තීරුවේ "රජයේ සේවයේ නො වන සේවක" යන්න සඳහන් කර ඔහුට ගෙවූ ගමන් වියදම් හා සංයුක්ත දීමනා පමණක් 5 වන තීරුවේ ද, ඡන්ද පොළ දීමනාව 9 වන තීරුවේ ද දැක්විය යුතුය.

12.5. මැතිවරණ කටයුතුවලට යොදවා ගනු ලබන රාජ්‍ය ආයතනවල රියදුරන්ට ගෙවීම් පිළිබඳ විස්තර මෙහි "බී ආකෘතිය" යටතේ වෙනම සඳහන් කළ යුතුය.

12.6. තම නිත්‍ය රාජකාරි සඳහා වාහනයක් අනුයුක්ත කර ඇති නිලධාරියෙකු මැතිවරණ රාජකාරි සඳහා එම වාහනය රැගෙන ගොස් ඇති අවස්ථාවන්හි දී එම වාහනය පැදවූ රජයේ සේවයේ රියදුරුට කරන ලද ගෙවීම් ද මෙම "බී ආකෘතියෙහි" සඳහන් කළ යුතු අතර එම රියදුරුගේ නම ඉදිරියේ 4 වන තීරුවේ එම වාහනය රාජකාරි සඳහා රැගෙන ගිය මාණ්ඩලික නිලධාරිගේ නම සඳහන් කළ යුතුය. (තේරීම්භාර නිලධාරි වෙත වාර්තා කළ සංචිත වාහනයක් සම්බන්ධයෙන් වන විට 4 වෙනි තීරුව හිස්ව තැබීම මැනවි.)

## 13. ගෙවීම් කඩිනම් කිරීම සඳහා කාර්යාලයීය නිලධාරීන්ට දීමනා

13.1. සියළුම නිලධාරීන්ගේ ගමන් වියදම්, අතිකාල හා දීමනා ඡන්ද විමසීමේ දින සිට දින 90 ක් ඇතුලත ගෙවා අවසන් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

13.2. ඡන්ද විමසීමේ කාර්යය සඳහා නිලධාරීන් විශාල පිරිසක් යෙදවීමට සිදු වූ කාර්යාල වලින් එම නිලධාරීනට තම ගෙවීම් ඉක්මණින් ලබා ගැනීම පහසු කරවීම සඳහා අදාල වවුචර් පරීක්ෂා කිරීම, සහතික කිරීම, උපලේඛන ගත කිරීම, චෙක්පත් ලිවීම, ගෙවීම් හා ගිණුම් තැබීම යනාදී සියළුම කාර්යයන්හි යෙදෙන කාර්යාලයීය නිලධාරීන්ට දිරිදීමනාවක් ගෙවීමට හැකි වන පරිදි මුදල් සපයා දෙනු ලැබේ.

13.3. මෙම චක්‍රලේඛයට අමුණා ඇති ඇමුණුම් ආකෘති අනුව සකස් කළ මැතිවරණ කාර්ය මණ්ඩල ගෙවීම් උපලේඛන නිවැරදිව හා ඉක්මණින් මැතිවරණ කොමසාරිස් වෙත ඉදිරිපත් කිරීම අනුව 13.2 හි සඳහන් කාර්යයන් වෙනුවෙන් දිරිදීමනාව ගෙවීමට අතිරේක මුදලක් ප්‍රතිපූර්ණය කරනු ලබන අවස්ථාවේ දී ඔබ වෙත සපයා දෙනු ලැබේ.

13.4. කෙසේ වුවද, ඡන්ද විමසීමේ දින සිට දින 90 කට පසුව මැතිවරණ කොමසාරිස් වෙත ලැබෙන උපලේඛන සඳහා ද, මෙම උපදෙස් වලින් බැහැර වෙමින් නියෝජ්‍ය/ ජ්‍යෙෂ්ඨ සහකාර/සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වෙත යවන උපලේඛන

සඳහා ද, සකස් කිරීමේ දෝෂ, යතුරු ලිවීමේ දෝෂ, එකතු කිරීමේ දෝෂ සහිතව ඉදිරිපත් කරන උපලේඛන සඳහා ද නිලධාරීන් 15 කට අඩු සංඛ්‍යාවකගේ ගෙවීම් ඇතුලත් උපලේඛන සඳහා ද ඉහත කී අතිරේක මුදල් සපයනු නො ලැබේ.

13.5. ගෙවීම් උපලේඛන මෙම කාර්යාලයට එවීමට පෙර විස්තර නිවැරදිව ඇතුලත්ව තිබේදැයි යන්න පරීක්ෂා කර බලන මෙන් ද, ගෙවිය යුතු මුදල් ප්‍රමාණ පිළිබඳ විස්තර යතුරු ලිවීමෙන් පසු නැවත එකතු කර බලන මෙන් ද ඉල්ලන අතර **එම ආකෘති පත් පිටු කිහිපයකින් සමන්විත වන්නේ නම් පිටුවේ අගට එකතුව හා පිටු කිහිපයේ මුළු එකතුව අවසාන පිටුවේ අගට යෙදිය යුතුය**. එසේම ආදර්ශ ආකෘතියේ පරිදි **නිලධාරීන් සංඛ්‍යාව හඳුනා ගැනීම සඳහා නිලධාරීන්ගේ නම් ඉදිරියෙන් අනු අංකය** සඳහන් කළ යුතුය. ගෙවීම් ප්‍රතිපූර්ණය කිරීමෙන් පසු හෙළිදරව් වන සටහන් කිරීමේ හා යතුරු ලිවීමේ දෝෂ සම්බන්ධයෙන් මවෙත දැන්වීම අවශ්‍ය නො වන අතර අඩු වී ඇති මුදල් ප්‍රමාණ ඉහත සඳහන් ගෙවීම් කාර්ය මණ්ඩලයට ගෙවන දීමනාවෙන් හිලව් කර ගත යුතුය.

## 14. වෙනත් කරුණු

14.1. මෙහි 03 ඡේදයේ විස්තර සඳහන් නිලධාරීන්ට හා 9.1 ඡේදයේ සඳහන් රියදුරන්ට ඔබ කාර්යාලය මගින් ගෙවා ප්‍රතිපූර්ණය සඳහා මා වෙත ඉදිරිපත් කරන උපලේඛන ද, 04 ඡේදයේ විස්තර සඳහන් නිලධාරීන් හා 9.2 ඡේදයේ සඳහන් රියදුරන් කෙලින්ම තේරීම්භාර නිලධාරීන් වෙත හෝ නියෝජ්‍ය/ ජ්‍යෙෂ්ඨ සහකාර/ සහකාර මැතිවරණ කොමසාරිස් වෙත ඉදිරිපත් කළ යුතු වවුචර ද ඉතා කඩිනමින් ඉදිරිපත් කරන ලෙස ඔබගේ නිලධාරීනට උපදෙස් දිය යුතුය.

14.2. ඡන්ද විමසීමට අදාල සියළු ගෙවීම් සීමිත කාලයක් තුල අවසන් කළ යුතුව ඇත. නියෝජ්‍ය/ ජ්‍යෙෂ්ඨ සහකාර/සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් විසින් කරනු ලබන ගෙවීම් ඡන්ද විමසීම අවසන්ව දින 90 ක දී හෝ එම නිලධාරීන් විසින් දැනුම් දෙන පරිදි එයට පෙර අවසන් කරනු ඇත. එහෙයින් 04 හා 9.2 ඡේදයේ පරිදි ගෙවීම් ලබාගත යුතු නිලධාරීන් නියමිත දිනට පෙර වවුචර් ඉදිරිපත් නො කළහොත් ඔවුනට ගෙවීම් ලබාගත නො හැකි වනු ඇත.

14.3. ඔබ කාර්යාලය මගින් ගෙවීම් කර ප්‍රතිපූර්ණය සඳහා කෙරෙන ඉල්ලීම් ඉතා ඉක්මණින් මවෙත ඉදිරිපත් කළ යුතුය. ප්‍රතිපූර්ණය සඳහා වූ එම ඉල්ලීම් තේරීම්භාර නිලධාරීට හෝ නියෝජ්‍ය/ ජ්‍යෙෂ්ඨ සහකාර/සහකාර මැතිවරණ කොමසාරිස්ට නො යැවිය යුතුය.

14.4. මුදල් ප්‍රතිපූර්ණය සඳහා කෙරෙන ඉල්ලීම් ඉදිරිපත් කර දින 30 ක් තුල දී පිළිතුරක් නො ලද හොත් එම ලිපි අස්ථානගත වීමක් ලෙස සැලකිය යුතු අතර, ඒ පිළිබඳව ලියාපදිංචි තැපෑලෙන් මවෙත වාර්තා කළ යුතුය.

14.5. ඉන්ධන වියදම් ප්‍රතිපූර්ණය කිරීමේ මූලික කාර්යය මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රවාහන ශාඛාවෙන් ඉටු කරනු ලබන බැවින් ඒ පිළිබඳ ගැටළු ඇති වුවහොත් ප්‍රවාහන ශාඛාව ඇමතීමෙන් ඒ පිළිබඳ සියළු විස්තර ලබාගත හැකිය.

14.6. මෙම ඡන්ද විමසීම සඳහා ගෙවීම් 2010.07.15 වන දින අවසන් කිරීමට නියමිත හෙයින්, එදිනට පසුව ඉදිරිපත් කරන ඉල්ලීම් මෙන්ම විමසීම් ද ප්‍රතික්ෂේප කිරීමට සිදුවන බව කරුණාවෙන් සලකන්න.

14.7. ඉහත කී දිනට පෙර ඉදිරිපත් කර ප්‍රතිපූර්ණය කර නො ගන්නා වියදම් සම්බන්ධව සම්පූර්ණ වගකීම ගෙවීම් කළ නිලධාරී වෙත පැවරෙන බවත්, එම ගෙවීම් සම්බන්ධයෙන් මැතිවරණ දෙපාර්තමේන්තුව කටයුතු නො කරන බවත් කරුණාවෙන් සලකන්න.



දයානන්ද දිසානායක
මැතිවරණ කොමසාරිස්.

E:\Layani\2010\Parlimnent Elections\Ac.01.w.sh.10.26 Mar 01.doc

"ඒ" ආකෘතිය

මගේ අංකය :-
ඔබේ අංකය : එෆ්ර්/211/2010
දිනය :-

මැතිවරණ කොමසාරිස්,

## පාර්ලිමේන්තු මැතිවරණය - 2010.04.08

**<u>මැතිවරණ කාර්ය මණ්ඩලයට ගෙවීම</u>**

2010.04.08 දින පැවැති පාර්ලිමේන්තු මැතිවරණ ඡන්ද විමසීමේ රාජකාරි කටයුතුවල යෙදුණු මෙම ආයතනයේ නිලධාරීන්ට ඔබේ සමාංක හා 2010.04.09 දිනැති චක්‍රලේඛය අනුව රු. …………………………….............. කුත් ශත ……......… ක මුදලක් ගෙවා ඇත. එක් එක් නිලධාරියාට කරන ලද ගෙවීම් පිළිබඳ විස්තර පහත පරිදි වේ.

2. මෙම මුදල ප්‍රතිපූර්ණය කරණු පිණිස ………………………………………………………………….…………… නමින් චෙක්පතක් එවන්න.

ආයතනයේ නම :-
ආයතනයේ ලිපිනය :-
දුරකථන අංකය :-

…………………………………
(ආයතන ප්‍රධානියා)
පදවි නාමය : ………………………

| අනු අංකය | (01) නිලධාරියාගේ නම | (02) ස්ථිර තනතුර | (03) ඡන්ද විමසීමේ යෙදුණු දිස්ත්‍රික්කය | (04) රාජකාරි කටයුතු කළ තනතුර ප්‍ර.ග.නි./ ස.නේ.නි./ ජේ.ජ.සථා./ ක.ජ.ස්ථා./ ලිපිකරු/ කා.කා.ස. | (05) ගමන් වියදම් හා සංයුක්ත දීමනාව (සම්පූර්ණ කාර්යය සඳහා) | දීමනා (06) ඡන්ද පොළ කටයුතු | දීමනා (07) ගණන් කිරීම | දීමනා (08) නිකුත් කිරීම හා භාර ගැනීම | (09) රජයේ සේවයේ නොවන කා.කා.ස.ට දීමනාව |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1. | | | | | | | | | |
| 2. | | | | | | | | | |
| 3. | | | | | | | | | |
| 4. | | | | | | | | | |
| 5. | | | | | | | | | |
| 6. | | | | | | | | | |
| එකතුව | | | | | | | | | |

සකස් කළේ :-
අත්සන :
නම :
තනතුර :

පරීක්ෂා කළේ :-
අත්සන :
නම :
තනතුර :

"බී" ආකෘතිය

මගේ අංකය :-
ඔබේ අංකය :- එෆ්ර්/211/2010
දිනය :-

මැතිවරණ කොමසාරිස්,

## පාර්ලිමේන්තු මැතිවරණය - 2010.04.08
## <u>මැතිවරණ කාර්ය මණ්ඩලයට ගෙවීම</u>

2010.04.08 දින පැවැති පාර්ලිමේන්තු මැතිවරණ ඡන්ද විමසීමේ රාජකාරි කටයුතුවල යෙදුණු මෙම ආයතනයේ රියදුරන්ට ඔබේ සමාංක හා 2010.04.09 දිනැති චක්‍රලේඛය අනුව රු. ..............................................................................................................කුත් ශත.............................. ක මුදලක් ගෙවා ඇත. එක් එක් රියදුරුට කරන ලද ගෙවීම් පිළිබඳ විස්තර පහත පරිදි වේ.

2. මෙම මුදල ප්‍රතිපූර්ණය කරණු පිණිස ………………………………………………………..……… නමින් චෙක්පතක් එවන්න.

ආයතනයේ නම :-
ආයතනයේ ලිපිනය :-
දුරකථන අංකය :-

………………………………..
(ආයතන ප්‍රධානියා)
පදවි නාමය : …………………….

| අනු අංකය | (01) රියදුරුගේ නම | (02) වාහනයේ අංකය | (03) වාහනය වෙන් කළ / සංවිතයේ ද යනවග | (04) නිලධාරියෙකුට වෙන් කළ වාහනයක් නම් එම නිලධාරිගේ නම | (05) ඡන්ද විමසීමේ යෙදුණු දිස්ත්‍රික්කය | (06) ගමන් වියදම් හා සංයුක්ත දීමනාව (සම්පූර්ණ කාර්යය සඳහා) රු. ශත | (07) අතිකාල හා නිවාඩු දින වැටුප් රු. ශත |
|---|---|---|---|---|---|---|---|
| 1. | | | | | | | |
| 2. | | | | | | | |
| 3. | | | | | | | |
| 4. | | | | | | | |
| 5. | | | | | | | |
| 6. | | | | | | | |
| | එකතුව | | | | | | |

සකස් කළේ :-
අත්සන :
නම :
තනතුර :

පරීක්ෂා කළේ :-
අත්සන :
නම :
තනතුර :